**ශීර්ෂය - 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව**

**------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය,එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යයසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයට මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ 2017 දෙසැම්බර් 31 දිනට රු.110,848,832 ක් වූ ශේෂය, 2018 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ ආරම්භක ශේෂය දැක්විය යුතු වුවත්, එය රු.1,080,865,199 ක් ලෙස දක්වා තිබුණි. මේ අනුව ආරම්භක ශේෂය රු.970,016,367 ක් වැඩියෙන් දැක්වීමට හේතු වූ කරුණු හෙළිදරව් කර නොතිබුණි. | ආරම්භක ශේෂය වැඩියෙන් දැක්වීමට හේතු වූ කරුණු මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතු වීම. | විගණන නිරීක්ෂණ වලට එකඟතාවය දක්වන ලදී. |
| (ආ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටි දේපලෙහි අයිතිය ලබා ගෙන නොමැතිව, ඉඩම රු.911,500,000 ක් හා ගොඩනැගිලි රු.136,000,000 ක් වශයෙන් එකතුව රු.1,047,500,000 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | දේපලෙහි අයිතිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | - එම - |
| (ඇ) පිරිවැය රු.34,898 ක් වූ මූලධන වත්කම් මූල්‍ය නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ අඩුවෙන් දක්වා තිබුණි. | වත්කම් අත්පත් කර ගැනීම සඳහා දැරූ මූලධන වියදම් නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු වීම. | - එම - |
| (ඈ) වෙනත් මූලධන වියදම් යටතේ මධ්‍යම සංස්කෘතික අරමුදල, රජයේ දෙපාර්තමේන්තු, විදේශ ආයතන, පෞද්ගලික පාර්ශවයන් යනාදී මාර්ගවලින් ලැබුණු මුදලින් ගවේෂණ, කැණීම්, සංරක්ෂණ ව්‍යාපෘති කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළ දැරූ රු.83,773,014 ක් මූල්‍ය නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවට ඇතුළත් කර නොතිබුණි. | ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් දැරූ පිරිවැයට අදාළ මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන වාර්තාවලට ඇතුළත් කළ යුතු වීම. | - එම - |
| (ඉ) දෙපාර්තමේන්තුව විසින් ගවේෂණය, කැණීම්, සංරක්ෂණය කිරීමෙන් හඳුනාගත් | හඳුනාගත් හා තහවුරුකර ගත් පුරාවිද්‍යා ස්ථාන හා භාණ්ඩ | - එම - |

හා තහවුරු කර ගත් පුරාවිද්‍යා ස්ථාන, හා භාණ්ඩ යනාදී වත්කම් මත පදනම්ව දැරූ පිරිවැය නාමික වටිනාකම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

සඳහා දැරූ පිරිවැය නාමික වටිනාකම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වීම.

**1.6.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් " බී" ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.93,628,741 ක් වූ අතර පාලන ගිණුමේ ශේෂය රු.94,380,933 ක් විය. රු.752,192 ක් වූ වෙනස වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට සැසඳුම් කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශ ශේෂය හා පාලන ගිණුමේ ශේෂය අතර පවතින වෙනස සැසඳුම් කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | විගණන නිරීක්ෂණවලට එකඟතාවය දක්වන ලදී. |
| (ආ) මියයාම, විශ්‍රාම යාම, වැඩ තහනම් කිරීම, සේවය හැර යාම, සේවයෙන් නිදහස් කිරීම යනාදී හේතූන් මත දෙපාර්තමේන්තුවේ දැනට සේවයේ නොමැති සේවකයන්ගෙන් හා නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.4,551,937 ක් වූ ණය ශේෂ අතුරින් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් ඉකුත් වූ ණය ශේෂවල එකතුව රු.1,290,560 ක් විය. | අවශ්‍ය කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කර හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමට පියවර ගත යුතු වීම. | - එම - |

**1.6.3 තැන්පතු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.571(3) විධිවිධාන ප්‍රකාරව පහත තැන්පතු ශේෂයන් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | | |
| (අ) පුරාවිද්‍යාත්මක ස්ථාන ගවේෂණ, කැණීම්, සංරක්ෂණ, නඩත්තු හා නවීකරණ ව්‍යාපෘති වෙනුවෙන් 2013 | මුදල් ශේෂ නිදහස් කිරීමට හෝ නිරවුල් කිරීමට කඩිනමින් පියවර ගත යුතු | විගණන නිරීක්ෂණවලට එකඟතාවය දක්වන ලදී. |

| | | |
|---|---|---|
| වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් ලැබුණු මුදලින් වැඩ නිම කළ පසු ව්‍යාපෘති 82 ක ඉතිරි මුදල් රු.19,479,807 ක් මුදල් රෙගුලාසි ප්‍රකාර නිදහස් කිරීමට හෝ නිරවුල් කිරීමට කටයුතු නොකර තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි. | වීම. | |
| (ආ) 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ ව්‍යාපෘති 50 ක කටයුතු වෙනුවෙන් ලැබුණු මුදලින් 2018 දෙසැම්බර් 31 දිනට ඉතිරිය රු.62,548,483 ක් නිරවුල් කර නොතිබුණු අතර කටයුතු අත්හිටවූ හෝ වැඩ ආරම්භ නොකළ ව්‍යාපෘති 16 කට අදාලව ලැබුණු රු.13,677,475 ක ශේෂ නිරවුල් නොකර තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි. | වැඩ නිම කළ ව්‍යාපෘතිවලට අදාළ ඉතිරි මුදල් හා වැඩ ආරම්භ නොකළ ව්‍යාපෘති වලට අදාළ මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | - එම- |
| (ඇ) පුරාවිද්‍යාත්මක ස්ථාන කැණීම්, සංරක්ෂණ, අළුත්වැඩියා ව්‍යාපෘති 25 ක් වෙනුවෙන් රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, පෞද්ගලික ආයතන හා විදේශීය ආයතන වලින් ප්‍රදාන වශයෙන් 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලයේදී ලැබුණු අරමුදල් වලින් ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කර ඉතිරි මුදල් ශේෂ රු.21,719,249 ක් නිරවුල් කර නොතිබුණි. | ව්‍යාපෘතිවල ඉතිරි අරමුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | - එම - |
| (ඈ) පුරාවිද්‍යාත්මක ස්ථාන වල ඉදිකිරීම් හා නඩත්තු කොන්ත්‍රාත් 12 ක ගෙවීම් වලින් රඳවාගත් මුදල් රු.1,407,424 ක් නිරවුල් කිරීමට කටයුතු නොකර වර්ෂ 01 සිට වර්ෂ 04 දක්වා කාලයක් තිස්සේ රඳවා ගෙන තිබුණි. | රැඳවුම් මුදල් නිදහස් කිරීමට විට කටයුතු කළ යුතු වීම. | - එම - |

**1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) මුදල් පොත**<br>මුදල් රෙගුලාසි 446 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව මහජන බැංකුවේ යාපනය ශාඛාවේ ජංගම ගිණුමට අදාළ මුදල්පොත පවත්වා නොතිබුණු අතර මොණරාගල ශාඛාවේ ජංගම ගිණුම්වලට අදාළ මුදල් පොත් විධිමත් පරිදි පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 446 හි සඳහන් විධිවිධාන ප්‍රකාර මුදල් පොත විධිමත් පරිදි යාවත්කාලීන කර පවත්වාගත යුතුවීම. | විගණන නිරීක්ෂණවලට එකඟතාවය දක්වන ලදී. |
| **(ආ) දෙපාර්තමේන්තු සම්මත වැය ලෙජරය**<br>මුදල් රෙගුලාසි 447 ප්‍රකාර දෙපාර්තමේන්තු සම්මත වැය ලෙජරයක් විධිමත් පරිදි පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 447 හි සඳහන් විධිවිධාන ඇතුළත් වන පරිදි 138 වැනි පොදු පෝර්මය අනුව ඉතිරිව ඇති වෙන් කිරීම් හා බැදී ඇති බැරකම්ද දක්වා දෙපාර්තමේන්තු සම්මත වැය ලෙජරයක් විධිමත් පරිදි පවත්වා ගත යුතුවීම. | - එම- |
| **(ඇ) ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 451 ප්‍රකාර චෙක්පත්, මුදල් ඇනවුම් ලේඛනයක් විධිමත්ව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 451 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව ජී.ඒ.එම්.83 පොදු පෝර්මය පරිදි විධිමත් ලේඛනයක් පවත්වා ගත යුතුවීම. | - එම - |
| **(ඈ) ඇප ලේඛනය**<br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 891 (1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුවීම. | - එම - |

(ඉ) හානි පිළිබඳ ලේඛනය

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගත යුතුවීම. | - එම - |

(ඊ) ණය සහ අත්තිකාරම් ලේඛනය

| | | |
|---|---|---|
| 2017 ජුලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව ණය හා අත්තිකාරම් ලේඛනය විධිමත් පරිදි පිළියෙළ කර නොතිබුණි. | 2017 ජුලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව සීසී10 ආකෘතිය පදනම් කර ගෙන ණය හා අත්තිකාරම් ලේඛන විධිමත් පරිදි පිළියෙළ කළ යුතුවීම. | - එම - |

### 1.6.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | විගණන නිරීක්ෂණවලට එකඟතාවය දක්වන ලදී. |

| | | |
|---|---|---|
| ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | - එම - |

**1.6.6 නීති, රීති රෙගුලාසි වලට අනුකූල නොවීම**

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන් නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | | |
| (i) 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනතේ 6,7,8,9 වගන්ති | විධිවිධානවල නියමයන්ට පටහැනිව ඛනිජ හා පාෂාණ නිස්සාරණ බලපත්‍ර ලබාදීමට කටයුතු කර තිබුණි. | ආඥා පනතේ විධිවිධාන පරිදි විධිමත් ලෙස බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුවීම. | විගණන නිරීක්ෂණවලට එකඟතාවය දක්වන ලදී. |
| (ii) 1951 අංක 28 දරන මුද්‍රණකරුවන් ගේ හා ප්‍රකාශකයන්ගේ පනතේ 2 වගන්තිය | මුද්‍රණය කරන සෑම පොතකම, ග්‍රන්ථයකම පිටපත් 04 ක් සංරක්ෂණය සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට යොමු කිරීමට කටයුතු කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කර තිබුණු ග්‍රන්ථ 02 ක පිටපත් සංරක්ෂණය සඳහා යොමු කර නොතිබුණි. | පනතේ විධිවිධාන පරිදි කටයුතු කිරීමට පියවර ගත යුතුවීම. | - එම - |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |

| | | | |
|---|---|---|---|
| (i) XIV පරිච්ඡේදයේ 2,3 හා 4 වගන්ති | විධිවිධානවල නියමයන්ට පටහැනිව අවිධිමත් පරිදි සංයුක්ත දීමනා ගෙවා තිබුණි. | විධිවිධානයන්ට අනුකූලව සංයුක්ත දීමනා ගෙවීම් විධිමත් කළ යුතුය. | - එම - |
| (ii) XXXIII පරිච්ඡේදයේ 1.1 හා 1.4 වගන්ති | නීතිපතිවරයාගේ උපදෙස් විමසීමෙන් තොරව ගවේෂණ හා කැණීම් ව්‍යාපෘති කටයුතු සඳහා බාහිර පාර්ශව සමඟ ගිවිසුම්වලට එළඹී තිබුණි. | බාහිර ආයතන සමඟ ගිවිසුම්වලට එළඹීමේදී නීතිපතිවරයාගේ උපදෙස් විමසීමට කටයුතු කළ යුතුය. | - එම - |

**2.** **මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1** **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

-----------------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2011 පෙබරවාරි 02 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පුරාවිද්‍යා ස්ථාන, ගවේෂණ, කැනීම්, නඩත්තු, සංරක්ෂණ හා කළමනාකරණය වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදල උපයන ආදායමෙන් සියයට 25 ක් දෙපාර්තමේන්තුව වෙත වාර්ෂිකව සම්පාදනය කිරීමට යෝජිතව තිබුණද එම මුදල් ගෙවා නොතිබුණි. පහත අඩුපාඩු නිරීක්ෂණය විය. | | |
| (i) ලැබී තිබුණු අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කිරීම සඳහා ප්‍රමාණවත් ලෙස ව්‍යාපෘති හඳුනාගෙන විධිමත් පිළිවෙත් අනුව කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණු අතර 2016 වර්ෂයේදී රු.මිලියන 115 ක්, 2017 වර්ෂයේදී රු.මිලියන 233 ක් හා 2018 වර්ෂයේදී රු.මිලියන 364 ක් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන සලසා දී තිබුණි. | මධ්‍යම සංස්කෘතික අරමුදලින් ලැබිය යුතු අරමුදල් විධිමත් ලබාගැනීමට හා කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. | විගණන නිරීක්ෂණවලට එකඟතාවය දක්වන ලදී. |

| | | |
|---|---|---|
| (ii) 2017 වර්ෂයේදී ප්‍රතිපාදන සලසා දී තිබුණු පුරාවිද්‍යා ස්ථාන ගවේෂණ, කැනීම්, සංරක්ෂණ, නඩත්තු, වැඩි දියුණු කිරීම් ව්‍යාපෘති 184 කින් 2018 දෙසැම්බර් 31 දින වනවිට ව්‍යාපෘති 110 ක් පමණක් නිමකර තිබුණි. | ව්‍යාපෘති කටයුතු කාර්යක්ෂමව කිරීමට කඩිනම් පියවර ගත යුතු වීම. | - එම - |
| (iii) 2018 වර්ෂයේදී ව්‍යාපෘති 191 ක් සඳහා ප්‍රතිපාදන සලසා දී තිබුණද, ව්‍යාපෘති 11 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. සලසා තිබුණු රු. මිලියන 364 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 25 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර භෞතික කාර්යය සාධනය සියයට 26 ක් හා මූල්‍ය කාර්යය සාධනය සියයට 7 ක දුර්වල තත්ත්වයක පැවතුණි. | ව්‍යාපෘති කටයුතු හා අරමුදල් උපයෝජනය කාර්යක්ෂමව කිරීමට කටයුතු කළ යුතුවීම. | - එම - |
| (ආ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, ලංකා සංචාරක මණ්ඩලය හා ශ්‍රී ලංකා රක්ෂණ සමාගම රු.මිලියන 36.4 ක ප්‍රතිපාදන මත දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 03 ක 2018 දෙසැම්බර් 31 වන විට අවසන් විය යුතු වුවත් එහි සමස්ථ භෞතික හා මූල්‍ය කාර්ය සාධනය පිළිවෙළින් සියයට 20 ක් හා සියයට 22 ක් වශයෙන් දුර්වල තත්ත්වයක පැවතුණි. | ව්‍යාපෘති කටයුතු හා අරමුදල් උපයෝජනය කාර්යක්ෂමව කිරීමට කටයුතු කළ යුතුවීම. | - එම - |

**2.2** **බැංකු ගිණුම් මෙහෙයවීම**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) උතුරු මැද හා මධ්‍යම ප්‍රාදේශීය කාර්යාල වල ගනුදෙනු ක්‍රියාත්මක කිරීම සඳහා ආරම්භ කර ඇති ජංගම ගිණුම් දෙකක ගනුදෙනු ක්‍රියාත්මක නොකර එම කාර්යයන් ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරීවරයා විසින් ඉටුකර තිබුණි. ඊට හේතු වූයේ ප්‍රදේශීය කාර්යාලවල ගණකාධිකාරීවරයෙකු නොමැති වීම බව විගණනයට දන්වා තිබුණි. | ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් ගෙවීම් කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවීම. | විගණන නිරීක්ෂණවලට එකඟතාවය දක්වන ලදී. |
| (ආ) මහජන බැංකුවේ මොණරාගල හා යාපනය ශාඛාවේ ආරම්භ කළ ජංගම ගිණුම් දෙකක් 2015 දෙසැම්බර් 31 දින වනවිටත් අක්‍රීය තත්ත්වයේ පැවතුණු අතර 2015 ඔක්තෝබර් 23 දිනැති අංක 03/2015 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයේ විධිවිධාන පරිදි අක්‍රීය නිල බැංකු ගිණුම් වසා දැමීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන පරිදි අක්‍රීය බැංකු ජංගම ගිණුම් වසා දැරීමට කඩිනම් පියවර ගත යුතුවීම. | - එම - |
| (ඇ) මහජන බැංකුවේ යාපනය ශාඛාවේ ජංගම ගිණුම සඳහා මුදල් පොතක් පවත්වා නොතිබුණු අතර අවිධිමත් ලෙස මුදල් ශේෂය ගණනය කර තිබුණි. ගණනය කිරීම් අනුව මුදල් පොතේ ශේෂය 2016 දෙසැම්බර් සිට 2018 ජුනි දක්වා රු.1,147,611 ක අයිරාවක් පැවතුණු අතර බැංකු ප්‍රකාශයේ වූ රු.6,155 ක ශේෂය මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි. තවද බැංකු සැසඳුම් ප්‍රකාශ 2018 ජුනි දක්වා පමණක් පිළියෙළ කර තිබුණු අතර එම බැංකු සැසඳුම අනුව ගිණුමට බැර නොවූ මුදල් ශේෂ රු.14,814 ක් හා, හඳුනා නොගත් ගෙවීම් රු.235,731 ක් නිරවුල් කර නොතිබුණි. ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ කල් ඉකුත් වූ වටිනාකම රු.1,374,988 ක් වූ චෙක්පත් 18 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. | විධිමත් පිරිදි මුදල් පොතේ පිළියෙල කර මුදල් පොතේ ශේෂය බැංකු ශේෂය සමඟ සසඳා නිරවුල් නොකළ ශේෂ පියවීමට කටයුතු කළ යුතුවීම. | - එම - |
| (ඈ) මහජන බැංකුවේ තිඹිරිගස්යාය ශාඛාවේ ජංගම ගිණුමේ අවස්ථා 15 කදී ගිණුමට බැරවූ තැන්පත් මුදල් රු.248,298 ක් මාස | මුදල් රෙගුලාසි 396(ඇ) විධිවිධාන පරිදි නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවීම. | - එම- |

01 සිට මාස 05 දක්වා කාල පරාසයක් ඉක්මවා තිබුණද හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු නොතිබුණි.

| | | |
|---|---|---|
| (ඉ) ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 07 සිට මාස 27 දක්වා කල් ඉකුත් වූ රු.223,437 ක් වටිනා චෙක්පත් 59 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | - එම - |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1** **කාර්යභාරයන් ඉටු නොකිරිම**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 1940 අංක 09 දරන පුරාවිද්‍යා ආඥා පනතේ 6 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පුරාවිද්‍යා කැනීම් බලපත්‍ර නිකුත් කිරීම සඳහා පිළිවෙත් හා ක්‍රමවේද හඳුන්වා දී නොතිබුණු අතර ආඥා පනතේ 10 වගන්තියේ විධිවිධාන වලට පටහැනිව 2006 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා නිකුත් කළ බලපත්‍ර 121 ක් වෙනුවෙන් රු.363,000 ක් වූ බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. තවද පනතේ 3 වගන්තියේ විධිවිධාන වලට පටහැනිව ලබාදුන් බලපත්‍ර මගින් කළ කැනීම් වලින් සොයා ගත් පුරාවස්තු පිළිබඳව හඳුනාගැනීමට හා ඒවා දෙපාර්තමේන්තුවට අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව පිළිවෙත් හා ක්‍රමවේදයන් සැලසුම්කර විධිමත් පරිදි කැනීම් බලපත්‍ර නිකුත් කිරීමට හා කැනීම් වලින් සොයාගත් පුරාවස්තු පවරා ගැනීමට කටයුතු කළ යුතුවීම. | විගණන නිරීක්ෂණවලට එකඟතාවය දක්වන ලදී. |

**3.2** **වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාලය 12 ක, සංචාරක නිවාස 08 ක කලාප කාර්යාල , පුරාවිද්‍යා කෞතුකාගාර යනාදී ඉඩම් හා දේපලවල නීත්‍යානුකූල අයිතිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | දේපලවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුවීම. | විගණන නිරීක්ෂණවලට එකඟතාවය දක්වන ලදී. |
| (ආ) දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 03 ක සමාලෝචිත වර්ෂයට අදාළව වත්කම් සමීක්ෂණ කටයුතු 2018 මැයි 25 දින වනවිටත් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද ඉකුත් වර්ෂවල වත්කම් සමීක්ෂණ වලදී අනාවරණය වූ ඌනතා,අතිරික්ත හා වත්කම් අපහරණ සම්බන්ධයෙන් වූ ගැලපීම් ගිණුම්ගත කර නොතිබුණි. | වාර්ෂිකව වත්කම් සමීක්ෂණය කර අනාවරණය වන ඌනතා, අතිරික්ත හා අපහරණයන් පිළිබඳව ගිණුම්වල ගැලපීම් කළ යුතුවීම. | - එම- |

**3.3** **විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 02 කට සහ ඉකුත් වර්ෂ වලදී නිකුත් කළ විගණන විමසුම් 04 කට 2019 මාර්තු 31 දින වන විට ද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 452(i) විධිවිධාන ප්‍රකාරව විගණන විමසුම් පිළිබඳව පිළිතුරු කඩිනමින් ඉදිරිපත් කිරීමට අවධානය යොමු කළ යුතුවීම. | විගණන නිරීක්ෂණවලට එකඟතාවය දක්වන ලදී. |

**4.** **තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂනය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ------------------------ | ---------------- | ----------------------------- |
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව තිබුණත් සමාලෝචිත වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුව විසින් තම විෂයපථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් වෙනත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වී තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහි කර ගැනීමට කටයුතු කළ බවට තොරතුරු ඉදිරිපත් නොවීය. | තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම පිළිබඳ ඇගයීම සඳහා දත්ත පද්ධතියක් පිලියෙළ කළ යුතුවීම. | විගණන නිරීක්ෂණවලට එකඟතාවය දක්වන ලදී. |

**5.** **යහපාලනය**

------------

**5.1** **අභ්‍යන්තර විගණනය**

---------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ------------------------ | ------------ | ---------------------- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.133 විධිවිධාන පරිදි දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා ගණන්දීමේ නිලධාරියා විසින් අභ්‍යන්තර විගණකයෙකු පත්කළ යුතු වුවත්, පත්කිරීම් කර තිබුණේ 2018 ඔක්තෝබර් මාසයේදීය. මේ හේතුවෙන් අභ්‍යන්තර විගණන කටයුතු ප්‍රමාණාත්මකව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක වී නොතිබුණි. | පද්ධති හා පාලන ක්ෂේත්‍රයේ කටයුතු ශක්තිමත් කිරීම වෙනුවෙන් අභ්‍යන්තර විගණන කටයුතු කාර්යක්ෂමව කළ යුතුවීම. | විගණන නිරීක්ෂණවලට එකඟතාවය දක්වන ලදී. |

## 5.2 විගණන හා කළමනාකරණ කමිටුව

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව, කළමනාකරණ කමිටුව 2018 ඔක්තෝබර් මාසයේදී පිහිටුවා රැස්වීම් වාර 02 පවත්වා තිබුණු අතර අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී, සම්පත් සකසුරුවම් ලෙස හා කාර්යක්ෂමව භාවිතා කර ඇති බවට සහතික වීම සඳහා සමාලෝචනය ප්‍රමාණාත්මකව සිදු කිරීමට නොහැකි වී තිබුණි. | සම්පත් සකසුරුවම් හා කාර්යක්ෂම ලෙස උපයෝජනය කෙරේද යන්න පිළිබඳව සමාලෝචනය සිදු කළ යුතුවීම. | විගණන නිරීක්ෂණවලට එකඟතාවය දක්වන ලදී. |

## 6. මානව සම්පත් කළමනාකරණය

### 6.1 අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට බලපාන ජ්‍යෙෂ්ඨ සේවා මට්ටමේ පුරප්පාඩු එනම් අධ්‍යක්ෂ හා සහකාර අධ්‍යක්ෂ තනතුරු 40 ක් පුරප්පාඩු ඇති වී වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද, පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සඳහා කඩිනමින් බඳවා ගැනීම් කළ යුතු වීම. | විගණන නිරීක්ෂණවලට එකඟතාවය දක්වන ලදී. |
| (ආ) දෙපාර්තමේන්තුවේ උසස් කිරීමේ පරිපාටිය මේ දක්වාම අනුමත කර ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් තෘතියික සේවා මට්ටමේ තාක්ෂණික නිලධාරී තනතුරුවල පුරප්පාඩු 26 ක් වර්ෂ 05 ක කාලයක සිට පැවතුණි. | උසස් කිරීම් පරිපාටිය කඩිනමින් අනුමත කර ගෙන පුරප්පාඩු පිරවීමට අප්‍රමාදව කටයුතු කළ යුතු වීම. | - එම- |